*සැ. යු.* - මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2024 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගේ පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,390 - 2024 ජූනි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2024.06.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 186 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 ජූලි මස 12 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජූනි මස 28 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය.”**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## මහනුවර දිසා අධිකරණයේ දී ය

### පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

| | |
|---|---|
| නඩු අංක | : DMB 4/2016 |
| ස්වභාවය | : උකස් |
| කාර්ය පටිපාටිය | : සාමාන්‍ය |
| වටිනාකම | : රු. 43,00,000 |
| ඇස්කිසි අංකය | : 19/21 |

ගලහා, හේවාහැට පාර, අංක 60 දරන ස්ථානයේ ශාඛා කාර්යාලයක් පවත්වාගෙන යන (සීමාසහිත හැටන් නැෂනල් බැන්ක් යනුවෙන් කලින් හැඳින් වූ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී., අංක 179, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

*..............පැමිණිලිකාර සමාගම.*

1. වෛද්‍යරත්න ආරච්චිලාගේ සුරන් තුෂාර තෙන්නකෝන්, අංක 323, සියඹලාගොඩ, දන්තුරේ.

2. වෛද්‍යරත්න ආරච්චිලාගේ විමලානන්ද තෙන්නකෝන්, අංක 323, සියඹලාගොඩ, දන්තුරේ.

*................විත්තිකරුවන්.*

වර්ෂ 2018 ක් වූ මාර්තු මස 12 වැනි දින මහනුවර දිසා අධිකරණයේ නඩු තීන්දුව අනුව විත්තිකරු විසින් රු. 4,244,888.63 ක මුදලක් සහ 2015.12.01 වැනි දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිමවන තෙක් ඒ සඳහා නෛතික පොළිය ද, නඩු ගාස්තු ද, ඇස්කිසි ක්‍රියාත්මක කිරීමේ ගාස්තු ද, ඉහත නම් සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට ද, නියෝග කොට තීන්දු කර ඇත. (සිවිල් අභියාචනාධිකරණයේ අංක FA 37/21 නඩුව නිශ්ප්‍රභා කර ඇත.)

එකී ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කිසි බලපත්‍රයේ බලය පිට මා විසින් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2024ක් වූ ජූලි මස 19 වැනි දින ප. ව. 2.00 ට,**

ඉහත නම් සඳහන් විත්තිකරුගේ දේපළ පිහිටි මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැද පළාත කෝරළේ, සියඹලාගොඩ - 163 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සියඹලාගොඩ නමැති ගමේ පිහිටා ඇති ''කෝවිලගොඩ වත්ත" නමැති ඉඩම පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැද පළාත කෝරළේ, යටිනුවර ප්‍රාදේශීය සභා සීමාව තුළ සියඹලාගොඩ - 163 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ සියඹලාගොඩ හි පිහිටි "කෝවිලගොඩවත්ත" නමැති ඉඩමට වර්ෂ 1991 ක්වූ ජූලි මස 15 වැනි දින අවසරලත් මිනින්දෝරු කේ. බී. ලන්සකාරනායක විසින් මැන සාදන ලද අංක 363 දරන සැලැස්මේ ප්‍රකාර බෙදු වෙන්කල කැබලි අංක 1 දරන ඉඩමට මායිම් : උතුරට : පන්සල් වත්තේ පැල ඉනි වැටෙන් ද, නැගෙනහිරට : පාර ද, දකුණට : එල්. කුමාරසිංහ අයිතිවාසිකම් කියන සිංහල පේඩිගෙදර වත්තෙන් ද සහ බස්නාහිරට : එල්. දිසානායකට අයිති මෙම ඉඩමේ ඉතිරි කොටස ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහඅටක් (පර්. 18) විශාල ඉඩම, ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේත් සමග වේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්‍රිරු බී 430/286 යටතේ ලියාපදිංචි කර ඇත.

*ගෙවීමේ ක්‍රමය* :- වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. වෙන්දේසිය අවසන් කළ වහාම ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25% ක් මුදලින් ගෙවිය යුතු ය.

2. ඉතිරි 75%ක මුදල ලිත් මසක් ඇතුළත මහනුවර දිසා අධිකරණයේ තැන්පත් කළ යුතු ය.

3. රජයේ ගාස්තු සහ අනෙකුත් ගාස්තු ද මුදලින් ගෙවිය යුතු ය.

ඒ. ඒ. එන්. සී. අලුත්ගම,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්.

වර්ෂ 2024 ක් වූ මැයි මස 28 වැනි දින,
මහනුවර දිසා අධිකරණයේ දී ය.

06-151